# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2019/23 - 2017 මැයි මස 19 වැනි සිකුරාදා - 2017.05.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු ආඥා පනත යටතේ නිවේදනයයි**

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 01/2017)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2017 මැයි මස 03 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,<br>ලේකම්,<br>මුදල් අමාත්‍යාංශය.

2017 මැයි මස 19 වැනි දින,<br>කොළඹ 01,<br>මුදල් අමාත්‍යාංශයේ දී ය.

**යෝජනාව**

මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බව ද මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

1A - G 25618 — 37 (2017/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| ශීර්ෂ අංක (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරු බදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකක (6) |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය (4) | සාමාන්‍ය (5) | |
| **10.06** | | | **සහල්** | | | |
| | 1006.30 | - | පාහින ලද හෝ ඔප දමන ලද හෝ නොලද සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ සහල් | | | |
| | | | | | | |
| | 1006.30.10 | --- | රළු සහල් (කැකුළු) | | 30% හෝ කි. ග්‍රෑමයට රු. 50/- | කි. ග්‍රෑ. |
| | 1006.30.20 | --- | නාඩු සහල් (රතු හෝ සුදු) | | 30% හෝ කි. ග්‍රෑමයට රු. 50/- | කි. ග්‍රෑ. |
| | 1006.30.30 | --- | සම්බා සහල් (රතු හෝ සුදු) | | 30% හෝ කි. ග්‍රෑමයට රු. 50/- | කි. ග්‍රෑ. |
| | 1006.30.40 | --- | බාස්මතී සහල් (දිගු ඇට සහිත සහල්) | | 30% හෝ කි. ග්‍රෑමයට රු. 50/- | කි. ග්‍රෑ. |
| | 1006.30.90 | --- | අනෙකුත් | | 30% හෝ කි. ග්‍රෑමයට රු. 50/- | කි. ග්‍රෑ. |

06 - 337

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.